# 1.45 නොම් චොම්ස්කි විසින් ඉදිරිපත් කරන ලද ඊනියා අගාධ සංස්ථිතිය

ඒ.ඩබ්. සුරාජ් චන්දන
ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ක්‍රීඩා අමාත්‍යාංශය.

## ABSTRACT

පෘෂ්ඨය තුල වාක්‍යයන් විවිධ ක්‍රම වලට ප්‍රකාශ කලත් අගාධය තුල විශ්විය ලක්ෂණයක් තිබෙන බව නෝම් චොම්ස්කි ප්‍රකාශ කලද, වාක්‍යයක් වීමට බලපාන්නේ සිත තුල ඇතිවන ආරම්මණයයි. මෙය සැබෑ අගාධය ලෙස හැඳින්විය හැකිය. මෙයද එකම වාක්‍යයක්, එකම භාෂාවකින් කිහිපදෙනෙක් ඉදිරිපත් කලත් එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වූවකි.

" සුදු පිරිමි ළමයා සුදු ගැහැණු ළමයාව අල්ලයි"







ක්‍රියාව - ස්පර්ශය (ඇල්ලීම)

මෙම වාක්‍ය නිර්මාණය වීමට පුද්ගලයකු තුල ඇතිවන ආරම්මණය කුමක්දැයි සෙවිය යුතුය. මෙය රාගය මූලික වූයේ නම් ස්පර්ශයට අදාලව ආරම්මණය ඇතිවේ. තිව්‍රතා මට්ටම මූලික වූයේ නම් පාටට අදාලව ආරම්මණය ඇතිවේ. පිරිමි ළමයා හෝ ගැහැණු ළමයා මූලික වූයේ නම්, ඊට අදාලව ආරම්මණය ඇතිවේ.

ආරම්මණයේ ස්වභාවය අනුව එකම වාක්‍යය වූවත් පෘෂ්ඨයේදී විවිධ ඉදිරිපත් කිරීම් තිබිය හැකිය. එනම් ප්‍රකාශ කරන කාලය, හඬේ සැර, ප්‍රකාශ කිරීමේ ඉරියව් වෙනස හා රුධිර සංසරණ වේගය වැනි භෞතික වෙනස්කම් දැක ගත හැකිය. එම නිසා වාක්‍ය විචාරයට ආරම්මණයේ ස්වභාවයද සැලකිල්ලට ගතයුතු අතර එය විශ්වීය ලක්ෂණ පෙන්නුම් නොකරන්නක් බව තහවුරු කරගත යුතුවද ඇත.